කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

ශාස්ත්‍ර පීඨය

**ජනමාධ්‍ය ඩිප්ලෝමා පාඨමාලාව - 2017**

**DJ 01 – ජනමාධ්‍යවේද ඉතිහාසය**

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.** **කාලය පැය තුනයි.**

---

01. මුද්‍රණ ශිල්පයේ ඉතිහාසය සැකෙවින් දක්වමින් එය මානව සංස්කෘතියෙහි ප්‍රගතිය කෙරෙහි බලපෑ ආකාරය විස්තර කරන්න.

02. '19 වැනි සියවසේ මුල් දශක දෙකේදී ශ්‍රී ලංකාවේ පුවත්පතක් නොමැතිවීමේ අඩුපාඩුව සම්පූර්ණ වූයේ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය මගිනි.' විමසන්න.

03. ගෝලීය පරිමාණයෙන් මුද්‍රණ තාක්ෂණයේ සිදු වී ඇති සුවිශාල විපර්යාස ශ්‍රී ලාංකේය මුද්‍රිත මාධ්‍යයේ ප්‍රතිබිම්බනය වන ආකාරය විස්තර කරන්න.

04. රූපවාහිනියේ ආගමනයත් සමග ශ්‍රී ලාංකේය ජනමාධ්‍ය සංස්කෘතියෙහි ඇති වී තිබෙන වෙනස්කම් ඓතිහාසික පර්යාලෝකයක සිට විස්තර කරන්න.

05. අන්තර්ගතය, ඉදිරිපත් කිරීම හා භාෂා ව්‍යවහාරය කෙරෙහි සාවධාන ව ගුවන්විදුලි මාධ්‍යයෙහි ප්‍රවණතා දර්ශකයක් ලෙස එෆ්. එම්. නාලිකාවල කාර්යභාරය විචාරාත්මක ව විශ්ලේෂණය කරන්න.

06. සිංහල සිනමාව කෙරෙහි විශේෂ අවධානය සහිත ව දශක හතක් වූ ශ්‍රී ලාංකේය සිනමාවේ අභිවර්ධනීය අවස්ථා නිදර්ශනාත්මක ව විස්තර කරන්න.

*(අනෙක් පිටුවට)*

07. පක්ෂග්‍රාහී මාධ්‍ය හිමිකාරත්වය අතික්‍රමණය කිරීමට ශ්‍රී ලාංකේය පුවත්පත් ක්ෂේත්‍රයේ ප්‍රායෝගික හැකියාවක් තිබේද? විචාරාත්මක ව විග්‍රහ කරන්න.

08. පහත සඳහන් මාතෘකා අතරින් හතරක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

(i) ධර්මසේන පතිරාජ
(ii) ෆේස්බුක්
(iii) බුද්ධිමය දේපළ අයිතිය
(iv) ඩේලි නිවුස් සියවස
(v) ප්‍රසිද්ධ රැගුම්පාලක මණ්ඩලය
(vi) පුවත්පත් පැමිණිලි කොමිසම
(vii) ගුවන්විදුලි සංස්ථාවේ වෙළඳ සේවය
(viii) ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව